# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1837/43 - 2013 නොවැම්බර් මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2013.11.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය:* කො/ප්‍රාලේ/ඉඅත්/3/63/UDA.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ පරවශතාවේ විස්තරය :*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, (කොට්ඨාස අංක 20- කොටුව කොළඹ මහ නගර සීමාව තුළ) කොටුව ගමේ පිහිටි, මැනුම්පති විසින් පිළියෙල කරන ලද, මුලික පිඹුරු අංක මු. පි. කො. 9383 හි කැබලි අංක 1 වශයෙන් සඳහන් ඉඩම් කැබැලි එක (1)

*ඉඩමේ නම:* ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ වරිපනම් අංක 36, 40, 50, 81, 91, 95, 107, 115, 99 1/1, 99 1/3, 99 1/4,99 1/5, 99 1/6, 99 1/10, 99 1/12. 99 1/15, 99 1/16, 99 1/17, 99 1/18, 99 1/20, 99 1/22, 99 1/23, 99 1/30, 99 1/32, 99 1/34, 99 1/36, 99 2/1, 99 2/4, 99 2/6, 99 2/8, 99 2/12, 99 2/14, 99 2/18, 99 2/24, 99 2/26, 99 2/30, 99 2/32, 99 2/34, 99 2/36, 99 2/38, 99 2/42, 99 2/48, 99 2/54, 99 2/56, 99 2/63, 99 2/66, 99 2/70, 99 3/1, 99 3/7, 99 3/12, 99, 99 3/20 සහ 99 3/25 දරන ඉඩම.

*විස්තරය:* බිම් මහල සමග මහල් හතරක් සහිත ස්ථිර ගොඩනැගිලි 1 ක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ජීවක එදිරිසිංහ සහ මාධවී ප්‍රසංගා එදිරිසිංහ, නො. 50, බාන්ස් පෙදෙස, කොළඹ 07;ප්‍රමාණය: හෙක්. 0.2964.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම, තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2014 ජනවාරි 08 වැනි දින පූ. හා. 10.00 ට කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2014 ජනවාරි මස 01 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි.

ඩී. පී. වික්‍රමසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
කොළඹ.

2013 නොවැම්බර් මස 06 වැනි දින,
කොළඹ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ දී ය.

12 - 202

1A - G 018573 - 170 - (2013/11)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.